# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 51 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල (පැවරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2007 ඔක්තෝබර් මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 ඔක්තෝබර් මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 4.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි

**2007 අංක 51 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල (පැවරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2007 ඔක්තෝබර් මස 23 වන දින]

එල්.ඩී.—ඕ.62/2005

**ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල ආයුර්වේද දෙපාර්තමේන්තුවට පැවරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන විද්‍යාලයක් (මෙහි මින් මතු "විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන ) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය යන නාමය හා අභිධානය යටතේ 1982 අංක 30 දරන පනතින් සංස්ථාපනය කරන ලද හෙයින් ද : — පූර්විකාව.

වෛද්‍ය ශිෂ්‍යයන් පුහුණු කිරීම සඳහා සහ රෝගීන්ට නොමිලේ වෛද්‍ය ආධාර සැපයීම සඳහා ආයුර්වේද ශික්ෂණ රෝහලක් එකී විද්‍යාලය විසින් පිහිටුවා පවත්වාගෙන යනු ලැබූ හෙයින් සහ එකී විද්‍යාලය සංස්ථාගත කරන ලද දිනයේ සිට එකී ශික්ෂණ රෝහල එකී විද්‍යාලය යටතේ ක්‍රියාත්මකව පැවතුනු හෙයින් ද :

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24 ආ වගන්තිය යටතේ වූ නියමයන් මගින් එකී විද්‍යාලය උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනයක් වශයෙන් පිළිගෙන කැළණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධ කරන ලද හෙයින් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් එහි ආයුර්වේද ශික්ෂණ රෝහල එකී කැළණිය විශ්ව විද්‍යාලයට පවරනු ලැබූ හෙයින් ද :

එකී ආයුර්වේද ශික්ෂණ රෝහල පවරාගෙන එය කළමනාකරණය කරන ලෙස එකී කැළණිය විශ්ව විද්‍යාලය විසින් රජයෙන් ඉල්ලා ඇති හෙයින් සහ එසේ පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2007 අංක 51 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල (පැවරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. — ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

2—P L 001975-3,600 (2007/05)

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල ආයුර්වේද දෙපාර්තමේන්තුවට පැවරීම.

**2**. (1) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24ආ වගන්තිය යටතේ කරනු ලැබ 1995 පෙබරවාරි මස 23 වන දින අංක 859/12 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ප්‍රකාරව කැළණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධ කරන ලද්දා වූ ද මේ පනතේ උපලේඛනයේ වඩාත් සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලයට ඈඳා ඇති (මෙහි මින් මතු "රෝහල" යනුවෙන් සඳහන් කරනු ලබන ) රෝහල (නියමිත දිනට ඉහතින් වූ දිනයේ රෝහලේ කාර්ය සඳහා භාවිත කරන ලද සියලු සවිකිරීම් පිරියත උපකරණ හා කවර හෝ විස්තරයකට අයත් දේපළ ඇතුළුව ) ඒ සම්බන්ධයෙන් කවර ආකාරයක හෝ යම් වන්දි ගෙවීමක් හෝ වෙනයම් ගෙවීමක් නොමැතිව නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබිය යුතු ය.

(2) නියමිත දිනයට ඉහතින්ම වූ දිනයේ රෝහලේ සේවයේ නියුක්තව සිටිනු ලැබුවා වූ සියලුම තැනැත්තන් හට ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි සේවා නියුක්තිය පිරිනමනු ලැබිය යුතු අතර, නියමිත දිනයට ඉහතින් වූ දිනයේ ඔවුන් භුක්ති විඳි නියම හා කොන්දේසිවලට වඩා අඩු වාසි සහගත නොවන නියම හා කොන්දේසි මත ඔවුන් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු ය. තව ද ඔවුන් රෝහලේ කාර්ය මණ්ඩලයට පත්කරනු ලැබූ දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන ඔවුන්ගේ සේවා කාලය ආණ්ඩුව යටතේ වූ විශ්‍රාම වැටුප් සහිත සේවයක් ලෙස ගණන් ගනු ලැබිය යුතු වන්නේ ය :

එසේ වුව ද , එවැනි පිරිනැමීමක් භාර නොගනු ලබන සේවානියුක්තියන් නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ස්වේච්ඡාවෙන් තම සේවය හැරගියාසේ සලකනු ලබන අතර, ඔවුන් විශ්‍රාම යාමේ දී ඔවුන්ට හිමිකම් ඇති යම් අර්ථලාභ ඇතුළුව අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ ප්‍රමාණවත් වන්දි හෝ පාරිතෝෂික රජයෙන් ලබා ගැනීමට ඔවුන්ට හිමිකම ඇත්තේ ය.

(3) නියමිත දිනයේ සිට සහ ඉන් පසුව–

(අ) රෝහල සම්බන්ධව කැළණිය විශ්ව විද්‍යාලය විසින් හෝ ඊට විරුද්ධව පවරන ලදුව නියමිත දිනයට ඉහතින් වූ දිනයේ විනිශ්චයට භාජනව පවත්නා සියලු නඩු හා නඩු කටයුතු නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් හෝ එයට විරුද්ධව පවරන ලද නඩු සහ නඩු කටයුතු වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා පවත්වා ගෙන යනු ලැබිය හැකි ය.

(ආ) රෝහලට අදාළව කැළණිය විශ්ව විද්‍යාලයේ වාසියට හෝ ඊට විරුද්ධව ඇතුළත් කරන ලදුව නියමිත දිනයට ඉහතින් වූ දිනයේ ඉටු නොකර පවත්නා නඩු තීන්දු හා තීන්දු ප්‍රකාශ, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අවස්ථාවෝචිත පරිදි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වාසියට හෝ එයට විරුද්ධව ඇතුළත් කරන ලද නඩු තීන්දු හා තීන්දු ප්‍රකාශ වශයෙන් සලකනු ලැබිය යුතු අතර , ඒ අනුව ඒ නඩු තීන්දු හා තීන්දු ප්‍රකාශ බලාත්මක කරනු ලැබිය හැකි ය.

(ඇ) රෝහලට අදාළ වූ ද, නියමිත දිනයට ඉහතින් වූ දිනයේ පවතින්නා වූ ද, කැළණිය විශ්ව විද්‍යාලයේ සියලු අයිතිවාසිකම් හා වගකීම් නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අයිතිවාසිකම් හා වගකීම් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ — අර්ථ නිරූපණය.

"කැළණිය විශ්ව විද්‍යාලය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25 ආ වගන්තිය යටතේ වූ නියමයක් මගින් පිහිටුවන ලද කැළණිය විශ්ව විද්‍යාලය අදහස් වේ.

උපලේඛනය (2 වන වගන්තිය)

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයේ මැද පත්තුවේ යක්කල නම් ග්‍රාමයේ පිහිටි කෝන්ගහවත්ත නම් ඉඩමෙන් මැන සාදන ලද අයි. ඒ. විජේතිලක මිනුම්දෝරු අධිකාරී තුමා විසින් 2003 .11 .12 දාතමින් සහතික කරන ලද අංක ගම්/ගම්/ 03/275-**B** සහ 2004 සැප්තැම්බර් හා ඔක්තෝබර් දරන අනුරේඛනයේ ලොට් අංක 1 ලෙස ලකුණු කොට ඇති ගම්පහ වික්‍රමාරච්චි රෝහල් සංකීර්ණය ඇතුළු සියලු ගහකොළ පළතුරු සහ ගොඩනැගිලි සහිත අක්කර එකයි පර්චස් තිස් පහයි දශම එකයි දෙකක (අ. 1 රූ. 0 පර්. 35.12 ) විශාලත්වයෙන් යුත් එකී ඉඩම වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.